### ගොවි සංවිධාන ඔස්සේ පැමිණෙන.............

# ගොවි ගැටළු සහ විසඳුම්

**ශ්‍රී ලංකාවේ ගොවි සංවිධාන දහසකට අධික සංඛ්‍යාවක් ඇති අතර ක්‍රියාකාරිව පවතින්නේ සීමිත සංඛ්‍යාවකි.** ගොවි සංවිධාන බිහි කිරීමට අවශ්‍ය මග පෙන්වීම සිදුකර ඔවුන්ගේ අවශ්‍යතාව අනුව ඒවා පිහිටුවීමට අවස්ථාව ලබාදීම සිදු වූයේ නම්, මෙපමණ ක්‍රියාකාරී නොවන නාමික ගොවි සංවිධාන ගණනක් බිහි නොවනු ඇත. කෙසේ වෙතත්, මෙලෙස ගොවි සංවිධාන බිහිවීම තුලින් ගොවි සංවිධාන පිළිබඳව අවතක්සේරුවක් රට තුළ නිර්මාණය වී ඇති බව පෙනී යයි.

**නිෂ්පාදකයාට ලැබෙන මිලත්, පාරිභෝගිකයාට ගෙවන මිලත් අතර දැඩි පරතරයක් තිබීම තවත් අලෙවිකරණ ප්‍රශ්නයක් ලෙස මාධ්‍යවේදීහු දක්වති.**

ගොවින්ට හා ගොවි සංවිධාන වලට බලපාන ප්‍රශ්න විවිධ වන අතර, ප්‍රාදේශීය විෂමතා ඒ කෙරෙහි තදින් බලපාන බව සඳහන් කළ යුතුය. මේ හේතුවෙන් එක් එක් ප්‍රදේශ වලට අදාලව බලපාන ප්‍රශ්න හා ඔවුන්ගේ විසඳුම් මෙන්ම ගොවි සේවන නියාමක මහතුන් දක්වන අදහස් ද වැදගත් වේ.

**අනුරාධපුරය, කුරුණෑගල, මාතලේ, නුවරඑළිය** හා **මාතර** යන දිස්ත්‍රික්ක වලින් තෝරාගත් ගොවිජන කේන්ද්‍ර 06 ක කරන ලද සමීක්ෂණයක් ඇසුරින් මෙම තොරතුරු ඉදිරිපත් කෙරේ. **තිරප්පනේ, අඹන්පොල, ගලේවෙල, හඟුරන්කෙත, බුළුගහපිටිය** හා **පිටබැද්දර** ගොවිජන කේන්ද්‍රවල සලකා බලනු ලැබූ ගොවි සංවිධාන 146 න් දුර්වල සංවිධාන 25.3% ක් වූ අතර, මධ්‍ය මට්ටමේ සංවිධාන 63 ක් හා ශක්තිමත් සංවිධාන 11.7% ක් තිබුණි. නමුත් වියළි කලාපීය හා තෙත් කලාපීය ගොවිජන කේන්ද්‍ර ලෙස වෙන්ව කරුණු ඉදිරිපත් කිරීම වඩාත් උචිත වේ.

## වියලි කලාපයට අයත් ප්‍රදේශයන්හි පොදු ගැටළු

**වියලි කලාපයේ කෘෂිකාර්මික කටයුතු වලට බලපාන ප්‍රධාන ගැටළුව වන්නේ ජලය හිඟයයි.** වගා ලිං එයට තරමක විසඳුමක් සපයයි. ගොවි සංවිධාන වලට බලපාන වියලි කලාපීය වර්ෂාපෝෂිත බිම්වල වගා කරන ගොවීන් හා ගොවි සංවිධාන නායකයින් ඉදිරිපත් කල, ප්‍රශ්න පහත සටහන් වේ.

**වියළි කලාපයේ කෘෂිකාර්මික කටයුතු වලට බලපාන ප්‍රධාන ගැටළුව වන්නේ ජල හිඟයයි.**

* ගොවි සංවිධාන ශක්තිමත් කිරීමට රාජ්‍ය ආයතනවල මැදිහත්වීම ප්‍රමාණවත් මට්ටමක නොවීම.
* ගොවි සංවිධාන මගින් එහි සාමාජිකයන්ට ලබාදෙන අනුග්‍රහය ප්‍රමාණවත් නොවන බව
* ගොවි සංවිධානවල රැස්වීම් වලට ගොවි ජන සහභාගිත්වය මද බව.
* කණ්ඩායම් සංකල්පය හා එමගින් ගොවීනට ලැබෙන ප්‍රයෝජන පිළිබඳ දැනුම අල්ප වීම
* ගොවීන්ගේ ගැටළු විසඳීමට ආයතනික සහාය අඩු බව හා එම ගැටළු නොවිසඳ සංවිධාන ක්‍රියාකාරිව ඉදිරියට ගෙන යා නොහැකි බව.
* කෘෂිකාර්මික කටයුතු පිළිබඳව නව දැනුම අඩුවීම නිසා ගොවීන් සාම්ප්‍රදායික ගොවිතැන කිරීමෙන් අඩු අස්වැන්නක් හා අඩු ආදායමක් ලැබීම
* ගොවි සංවිධාන වලට නීතිමය බලතල අඩු බව. එබැවින්, ගොවි සංවිධාන, කණ්ඩායම් වගකීම් ඉටු

නොකරන්නන්ට විරුද්ධව ක්‍රියා කිරීමට මැලිවීම.

* නිෂ්පාදනවල ගොවිපල මිල අඩුකම, මෙම හේතුව නිසා ගොවීන් කෘෂිකර්මය හෝ ගොවි සංවිධාන ක්‍රියා වලට උනන්දු නොවීම.

**ගොවි සංවිධාන වලට අනුග්‍රහය හා නිසි මග පෙන්වීම රාජ්‍ය ආයතන මගින් සිදුකල යුතුය.**

**මෙම ප්‍රශ්න වලට විසඳුම් ලෙස පොදුවේ ගොවි නායකයින් ඉදිරිපත් කරනු ලැබූ කරුණු පහත සටහන් වේ.**

* **ගොවි සංවිධාන වලට අනුග්‍රහය හා නිසි මග පෙන්වීම රාජ්‍ය ආයතන මගින් සිදුකල යුතුය.**

* ගොවි සංවිධානවලට නෛතික බලතල ලැබිය යුතු අතර එමගින් සංවිධානයේ පොදු නීති කඩකරන්නන්ට විරුද්ධව කටයුතු කිරීමට හැකිවනු ඇත.

* **ගොවි සංවිධාන සංකල්පය,** එහි විභවතාව හා ප්‍රතිලාභ පිළිබඳව ගොවීන් දැනුවත් කළ යුතුය.

* ගොවි සංවිධාන හරහා ගොවීන්ට ණය පහසුකම් හා යෙදවුම් සැපයීමට නිසි ක්‍රමයක් සැකසිය යුතුය.

* යෙදවුම්, ණය හා වාරි ජලය වැනි සෙසු පහසුකම් නියමිත වේලාවට සපයා දීම මගින් ගොවීන් දිරිමත් කළ යුතුය.

* ගොවි සංවිධාන වලට සහභාගිත්වය වැඩි කිරීමට යොමුවන කටයුතු රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන මගින් සිදුකර වැඩසටහන් ගොවි සංවිධාන හරහා ක්‍රියාත්මක කරවිය යුතුය.

* ග්‍රාමීය මට්ටමේ ඇති නීත්‍යානුකූල සංවිධානයක් ලෙස ගොවි සංවිධානය පිළිගැනීම රාජ්‍ය ආයතන විසින් සිදුකළ යුතුය.

**මෙම බල ප්‍රදේශයේ ගොවි සේවන නියාමකයින් දක්වන අන්දමට ගොවි සංවිධාන වලට බලපාන ප්‍රශ්න මෙසේ ය.**

* ගොවි සංවිධාන කටයුතු වලට ගොවීන්ගේ සහභාගිත්වය අඩුබව

* ගොවි සංවිධාන මගින් එහි සාමාජිකයන්ට ප්‍රතිලාභ නොලැබීම

* කණ්ඩායම් ක්‍රියාකාරිත්වය හා එහි ප්‍රයෝජන පිළිබඳව පැහැදිලි අවබෝධයක් ගොවීන් තුළ නොමැතිකම.

* කෘෂිකාර්මික හා ගොවි සංවිධාන කටයුතු වලදී ආයතන හා සංවිධාන වලින් ප්‍රමාණවත් ආධාර උපකාර නොලැබීම.

* ගොවීන් අතර අන්‍යොන්‍ය සහයෝගය මද බව.

* ගොවි සංවිධාන වලට නෛතික බලය අඩු බව.

* පවතින වෙනත් ස්වේච්ඡා සංවිධාන වලින් ගොවීන්ට වැඩි ප්‍රතිලාභ ලැබීම, එවැනි තමන්ට ප්‍රයෝජනවත් වන සංවිධාන වෙත ගොවීන් යොමුවීම.

**මෙම ප්‍රශ්නවලට ගොවි සේවන නියාමකයින් ඉදිරිපත් කරන විසඳුම් පහත සඳහන් වේ.**

* ගොවීන්ගේ ප්‍රධාන ප්‍රශ්න වලට විසඳුම් ලබාදීම

* යෙදවුම් හා අනිකුත් සේවා ගොවි සංවිධාන හරහා ලබාදීම

* ආයතනවල සහයෝගය හා නිසි මග පෙන්වීම ගොවි සංවිධාන වලට ලබාදීම

* ගොවීන් දැනුවත් කිරීම සඳහා නිසි පුහුණුව ලබාදීම

* ගොවීන්ට සහන සැලසෙන වැඩසටහන් ගොවි සංවිධාන මගින් ක්‍රියාත්මක කරවීම සඳහා අදාළ ආයතන ක්‍රියාත්මක විය යුතුය.

* ගොවි නිෂ්පාදන සඳහා හොඳ මිලක් සහතික කිරීම මගින් ගොවීන් ගොවිතැනට නැඹුරු කිරීමෙන් ක්‍රියාකාරීව ගොවි සංවිධාන වලට ගොනු වීමක් සිදු කිරීම

* ගොවි සංවිධාන ඉල්ලීම් වලට ප්‍රමුඛතාව ලබා දෙමින් ගොවි සංවිධාන වලට අවධානය යොමු කිරීමට අදළ ආයතනවල නිලධාරීන් කටයුතු කළ යුතුය.

**ගොවීන්ගේ ප්‍රශ්න වලට විසඳුම් ලබාදීම සඳහා ගොවි සංවිධාන ඔවුන් විසින්ම වැඩසටහන් පිළියෙල කිරීම වඩාත් උචිත වන අතර එහිදී රාජ්‍ය ආයතන උපකාර ලබාදිය යුතු වේ.**

ගොවි මහතුන් හා ඔවුන්ට

ගොවි සංවිධාන ලෙස ඒකරාශී කිරීම සඳහා අවශ්‍ය සහාය දක්වන ගොවි සේවන නියාමකයින් දක්වන ඉහත අදහස් මගින් පෙනී යන ආකාරයට ගොවි සංවිධාන වලට අවශ්‍ය මග පෙන්වීම හා **තම සංවිධානයේ රීති පදනම් කර ගනිමින් ගොවි සංවිධානවල පොදු නීති ක්‍රියාවේ යෙදවිය හැකි බව සමහර සංවිධාන ක්‍රියාකාරිත්වය තුලින් පෙන්වා දී ඇත.** රාජ්‍ය ආයතනවල සහයෝගය ගොවි සංවිධාන

**ගොවි සංවිධාන වලට නෛතික බලය ලැබීම හා එය වැඩි දියුණු කිරීම කළ යුතු වුවද, තම සංවිධානයේ රීති පදනම් කර ගනිමින් ගොවි සංවිධානවල පොදු නීති ක්‍රියාවේ යෙදවිය හැකි බව සමහර සංවිධාන ක්‍රියාකාරිත්වය තුලින් පෙන්වා දී ඇත.**

අනුග්‍රහය දක්වීම රාජ්‍ය ආයතන තුලින් සිදුකළ යුතු වේ. මෙම තත්ත්වය තරමක් දුරට ඉටුකළ හැකි නමුත් දක්ෂ හා ක්‍රියාකාරී ගොවි පිරිසක් සිටින ස්ථානවල මෙය ගැටළුවක් බවට පත්වී නැත. **ගොවීන්ගේ ප්‍රශ්න වලට විසඳුම් ලබාදීම සඳහා ගොවි සංවිධාන ඔවුන් විසින්ම වැඩසටහන් පිළියෙල කිරීම වඩාත් උචිත වන අතර එහිදී රාජ්‍ය ආයතන උපකාර ලබාදිය යුතු වේ.**

ගොවි සංවිධාන මගින් යෙදවුම් හා සේවා ලබාදීම සඳහා මීට වඩා අවධානයක් දක්විය යුතු අතර සමහර ගොවි සංවිධාන දැනටමත් යෙදවුම් සහතදයිව ලබාදීමට පියවර ගෙන තිබේ. තොග වශයෙන් මිලදී ගෙන තම සාමාජිකයින්ට යෙදවුම් ලබාදීමේදී සුළු ලාභයක් තබා ගැනීම මගින් වෙළෙන්දන්ගේ ග්‍රහණයෙන් ගොවීන් මුදවා ගැනීමට හැකියාව ලැබේ.

**ගොවි සංවිධාන වලට නෛතික බලය ලැබීම හා එය වැඩි දියුණු කිරීම කළ යුතු වුවද,** වෙත වැඩි කිරීම අවශ්‍ය වුවද, දැනටමත් ප්‍රදේශ කිහිපයක හොඳ සහයෝගයකින් කටයුතු කෙරේ. එවන් තත්ත්වයන් සෙසු ප්‍රදේශවල ඇතිකළ යුතු වේ.

රාජ්‍ය ආයතන මගින්, **ගොවි සංවිධාන සංකල්පය,** එම සංවිධානවල විභවතාව හා ප්‍රතිලාභ පිළිබඳව ගොවි සංවිධානවල සාමාජිකයින් සියල්ල දැනුවත් කිරීම දුෂ්කර වේ. නමුත් අදාළ පුහුණුව ලබා ඇති ගොවි සේවන නියාමකයින් හා සුදුසු ගොවි මහතුන්ගේ සේවය ලබාගැනීම මගින් එය ඉටු කර ගැනීමේ හැකියාව ලැබේ.

නිෂ්පාදන සඳහා හොඳ මිලක් ලබාගැනීම හා ණය පහසුකම් ලබාගැනීම සඳහා ගොවි සංවිධාන වලට කටයුතු කළහැකි අතර, අදාළ ආයතන සමඟ සම්බන්ධතා තබා ගැනීම එහිදී අවශ්‍ය වෙයි. **චක්‍රීය ණය** ආදී විවිධ ක්‍රම මෙහිදී භාවිතා කළ හැකිය. **වගා කරන බෝග නිසි පරිදි තෝරා ගැනීමට කටයුතු කිරීම හා වෙනත් ප්‍රදේශවල ගොවි සංවිධාන සමඟ නිෂ්පාදන හුවමාරු ක්‍රම ක්‍රියාවට නැංවීම අලෙවියේ දී පහසුවක් වනු නොඅනුමානය.**

## තෙත් කලාපීය ප්‍රදේශයන්හි ගැටළු

තෙත් කලාපයට අයත්, වර්ෂාපෝෂිත බිම්වල ප්‍රධාන වශයෙන් එළවළු වගාවන් සිදුකරන ගොවීන්ගේ ප්‍රශ්න ඉහත දක්වූ ඒවාට වඩා තරමක වෙනස් ස්වරූපයක් ගනී. එහිදී අලෙවිය ප්‍රමුඛ ස්ථානයක් ගන්නා බව පෙනේ.

ප්‍රදේශයේ ගොවි නායකයන් හා ගොවීන් දක්වන ආකාරයට ප්‍රශ්න වන්නේ.

* නිෂ්පාදන සඳහා නිසි මිලක් නොලැබීම, එළවළු වෙළඳමේදී නිෂ්පාදකයා අතරමැදියන්ගේ විශාල බලපෑමකට ලක්වීම සහ එයට කිසිම ආයතනයක් විසඳුම් ලබාදීමට පියවර නොගැනීම.
* **ගොවි සංවිධානවල වැදගත්කම,** විභවතාව හා ඉන් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව ගොවීන් දැනුවත්ව නොසිටීම.
* ගොවි සංවිධාන සඳහා අදාළ ආයතනවල සහාය ප්‍රමාණවත් මට්ටමකට නොලැබීම

**වගා කරන බෝග නිසි පරිදි තෝරා ගැනීමට කටයුතු කිරීම අලෙවියේ දී පහසුවකි.**

* ගොවි සංවිධාන ශක්තිමත් කිරීම සඳහා රාජ්‍ය ආයතන නිසි මග පෙන්වීමක් සිදු නොකිරීම

* ගොවිතැන් කටයුතු සඳහා ගොවීන් පෞද්ගලික වෙළඳුන්ගෙන් ණය ලබාගැනීම හේතුවෙන් ඔවුන්ගේ නිෂ්පාදන අඩු මිලකට එම වෙළඳුන්ට විකිණීමට සිදුවීම.

* සාධාරණ මිලකට බීජ හා පොහොර ලබා ගැනීමට ගොවීන්ට පහසු කම් නොමැතිවීම.

* ගොවි සංවිධාන සාමාජිකයෙකු වීමෙන් ගොවීන්ට විශේෂ ප්‍රතිලාභ නොලැබීම

* ගොවීන් ඒකරාශි කිරීමට ගොවි සංවිධාන නායකයන්ට පවතින දුෂ්කරතා

* ගොවි සංවිධානවල දුර්වල නායකත්වය

* ගොවි සංවිධාන කටයුතු සඳහා සාමාජිකයන්ගේ උනන්දුවක් නැතිකම

* ගොවි සංවිධාන රැස්වීම් වලට සහභාගි වීම මදවීම හා එම සංවිධාන වෙනුවෙන් මුදල් යෙදවීමට ඇති අකැමැත්ත.

තෙත් කලාපයේ ගොවි නායකයන් දක්වන අන්දමට ගොවි සංවිධාන හා ගොවීන්ගේ ප්‍රශ්න වලට විසඳුම් මෙසේය.

* ගොවි සංවිධාන වලට ගොවීන් සහභාගි කරවා ගැනීම සඳහා ගොවීන්ගේ ප්‍රශ්න විසඳ දීම අත්‍යාවශ්‍ය වේ.

* ගොවි සංවිධාන ප්‍රතිලාභ ලබාදෙන ඒවා වියයුතු අතර එය ගොවීන්ගේ අවශ්‍යතා අනුව පිහිට විය යුතුය.

* ගොවීන් සඳහා, කණ්ඩායම් හා නව කෘෂිකාර්මික දැනුම ලබාදෙන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.

* රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන, ගොවි සංවිධාන මගින් ඔවුන්ගේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම උචිත වන අතර එමගින් ගොවීන් වැඩි පිරිසකට ප්‍රතිලාභ ලැබීමේ අවස්ථාව සැලසේ.

* සාධාරණව ගොවි සංවිධානයේ සෑම සාමාජිකයෙකුටම ඵල ප්‍රයෝජන ලැබීම සහතික කළයුතු වේ. ගොවීන්ගේ අවශ්‍යතා විවිධ නිසා ඒවා විමසා කටයුතු කිරීම ගොවි සංවිධානවල කාර්යය විය යුතුය.

**ගොවි සංවිධාන ලාභ ලබන ඒවා බවට පත්කළ යුතුය.**

* ගොවි කණ්ඩායම් හා රාජ්‍ය නිලධාරීන් අතර සම්බන්ධීකරණය ශක්තිමත් කළ යුතු ය.

* ගොවීන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීමට උපකාරී වන වැඩසටහන් ගොවි සංවිධාන මගින් ක්‍රියාවට නැංවීමට අදල ආයතන කටයුතු කළ යුතු ය.

* හොඳ තත්ත්වයේ බීජ හා පොහොර වැනි යෙදවුම් ලබාදීමට ගොවි සංවිධාන කටයුතු කළ යුතුය.

* ගොවීන්ගේ ආර්ථිකය සංවර්ධනය කිරීම සඳහා ආහාර ද්‍රව්‍ය ආනයනය සඳහා වන රජයේ ප්‍රතිපත්තිවල වෙනස්කම් සුදුසු ආකාරයෙන් ඉටු කිරීම.

* තාක්ෂණය ලබාදීම මගින් කෘෂිකාර්මික කටයුතු වලට ගොවීන් දිරිමත් කළයුතුය.

**තෙත් කලාපීය එළවළු වගා කරන ප්‍රදේශවල ගොවි සංවිධාන වලට බලපාන ප්‍රශ්න පිළිබඳව ගොවි සේවන නියාමකයින්ගේ අදහස් මෙසේය.**

* රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වලින් ගොවි සංවිධාන වලට ප්‍රමාණවත් පහසුකම් නොලැබීම

* ගොවි නිෂ්පාදන වලට අඩු මිලක් ලැබීම

* අලෙවි ගැටළු වලට පිළියම් අඩුකම / පිළියම් නොකිරීම

* ගොවීන්ට යෙදවුම් ලබා ගැනීමට හා ණය පහසුකම් ලබාගැනීමට වෙළඳුන් මත යැපීමට සිදුවීම. මෙම පහසුකම් ලබා දීමට රාජ්‍ය ආයතන දුර්වලව ක්‍රියාත්මක වීම හේතුවෙන්, අඩු මිලට වෙළඳුන්ට නිෂ්පාදන විකිණීමට ගොවීන්ට සිදුව තිබීම.

* සංවිධාන වැඩ කටයුතු වලට ගොවීන්ගේ දුර්වල සහභාගීත්වය

* ගොවි සංවිධාන ශක්තිමත් කිරීම සඳහා රජයේ අනුග්‍රහය මදවීම.

* කණ්ඩායම් කටයුතු පිළිබඳව ගොවීන්ගේ අමිහිරි අත්දැකීම් නිසා ගොවි සංවිධාන හා එහි නායකයින් කෙරෙහි ගොවීන්ගේ විශ්වාසය අඩුබව.

* ගොවීන් හා ගොවි නායකයින් තුළ, ගොවි සංවිධාන හා එහි ක්‍රියාකාරිත්වය පිළිබඳව පවතින සීමිත අවබෝධය ගොවි සේවන නියාමකයින්

## ප්‍රතිලාභ ලබන තත්ත්වයට ගොවි සංවිධාන පත් කිරීම සඳහා එහි සාමාජිකයින්ගේ පූර්ණ කැපවීම අවශ්‍යය

ඉහත ගැටළු සඳහා ඉදිරිපත් කරන විසඳුම් වන්නේ

* රාජ්‍ය ආයතන මගින් උපරිම පහසුකම් ගොවි සංවිධාන වලට ලබාදීමෙන් ඔවුන් දිරිමත් කළ යුතුය. ඔවුන්ගේ වැඩසටහන් ගොවි සංවිධාන තුළින් ක්‍රියාවට නැගිය යුතුය.
* **ගොවි සංවිධාන ලාභ ලබන ඒවා බවට පත්කළ යුතුය.**
* ගොවීන් තම යෙදවුම් අවශ්‍යතා හා ගැටළු තිසි අවස්ථාවට යොමු කළ යුතු අතර එයට අවධානය යොමු කරමින් අදළ ආයතන ගැටළු විසදීමට ක්‍රියාකළ යුතුය.
* ගොවි සංවිධාන හා කණ්ඩායම් සංකල්පය පිළිබඳව ගොවි නායකයින් දැනුවත් කිරීමට පුහුණු සැසි පැවැත්විය යුතුය.
* ගොවි කණ්ඩායම් හා අදළ ආයතන අතර හොඳ සම්බන්ධීකරණයක් තිබිය යුතුය.
* ගොවි නිෂ්පාදන සඳහා හොඳ ගොවිපල මිලක් සහතික කිරීම මගින් ගොවීන් දිරිමත් කළයුතුය.
* තිසි පරිදි නිර්මාණාත්මක හා ඵලදයී යෝජනා ඇතුලත් වන සේ රැස්වීම් පැවැත්විය යුතුය.
* ගොවි සංවිධාන සියල්ල එක්වී ඒකාබද්ධ සංවිධානයක් ගොවිජන කේන්ද්‍රබල ප්‍රදේශ තුළ ඇති කළ යුතුය.

තෙත් කලාපයේ ගොවීන්ගේ ප්‍රශ්න වලට විසඳුම් ලෙස එම ගොවි නායකයින් හා ගොවිසෙවන නියාමකයින් දක්වා ඇති අදහස් වලින් පෙනී යන්නේ ගොවීන්ගේ ප්‍රශ්න විසඳීම, ගොවි සංවිධාන වලට ගොවීන් සහභාගිකරවා ගැනීමට අවශ්‍ය බවකි. මෙහිදී ගොවි සංවිධාන මගින් අපේක්ෂා කරන්නේ හැකිතාක් දුරට ඔවුන්ම ගැටළු වලට විසඳුම් ලබා ගැනීමට පියවර ගැනීමයි. මුලින් ගොවි සංවිධානය මගින් ගොවීන්ගේ පොදු හා හදිසි එපමණටම පහසුවෙන් ඉටු කළහැකි ප්‍රශ්න විසඳීමට සාමූහික ප්‍රයත්න දරා ක්‍රමයෙන් දුෂ්කර ගැටළු විසඳීමේ දී අදළ ආයතනවල සහාය ලබා ගත යුතු වේ. **ප්‍රතිලාභ ලබන තත්ත්වයට ගොවි සංවිධාන පත් කිරීම සඳහා එහි සාමාජිකයින්ගේ පූර්ණ කැපවීම අවශ්‍යය.** එමගින්, ස්ථිරසාර හා ඵලදයි සැලසුම් ක්‍රියාවට නැංවීම සිදු කිරීමේ හැකියාව ලැබේ.

සිදුකරන පුහුණු වැඩ සටහන්වල දැනුම, සෑම සාමාජිකයෙකු වෙතම ලැබෙන සේ ක්‍රම සංවිධානය කිරීමට ගොවි සංවිධාන කටයුතු කළ යුතු අතර අවශ්‍ය විටෙක නිළධාරීන් හෝ ගොවි සෙවන නියාමකගේ සහාය ලබා ගැනීම කළ යුතුය.

සාධාරණ ව ගොවි සංවිධාන නායකයින් කටයුතු කිරීම තුළින් සෙසු සාමාජිකයින්ගේ හිත දිනාගත යුතුව තිබේ. **පොදු තීරණ ක්‍රියාවේ යෙදවීම ඉතාමත් අවශ්‍ය වේ.**

ප්‍රදේශයට උචිත බීජ වර්ග නිපදවා ගැනීමට ගොවි සංවිධාන කටයුතු කලහොත් අවශ්‍ය වේලාවට එය වගාව සඳහා යොදගත හැකි අතර අතිරික්ත බීජ අලෙවි කිරීම මගින් හොඳ ආදයමක් ලබා ගැනීමට හැකියාව ලැබේ.

**සහභාගීත්ව ගැමි පිවිසුම** වැනි ක්‍රම උපයෝගී කරගෙන නිළධාරීන් ගොවීන් සමඟ සාමූහිකව අවශ්‍යතා, සම්පත් හා බාධක තක්සේරු කර උචිත වැඩ පිළිවෙලවල් ක්‍රියාවට නැගිය යුතුය. එමගින්, ප්‍රමුඛතාව පදනම් කරගෙන බහුතර ගොවි පිරිසකගේ සහභාගීත්වය හා ආශිර්වාදය ඇතිව ගොවි සංවිධානය මගින් ව්‍යාපෘති ඇරඹීමට පුළුවන.

පියවරින් පියවර ගොවි සංවිධාන වලට පැන නගින ගැටළු විසඳීම මගින් ගොවි සංවිධාන කරා ගොවීන් යොමු වීමටත් එහි කාර්යයන්ට දයකවීම මගින් ගොවි සමාගම් ලෙස වෙනස්වීමට කටයුතු කිරීම වර්තමාන ආර්ථික රටාව තුළ ගොවීන්ගේ පැවැත්ම සඳහා අත්‍යාවශ්‍ය වේ.

**ගොවි සමාගම් මගින් වඩාත් ආර්ථික සංවර්ධනයකට නැඹුරු වන ව්‍යාපාර ආරම්භ කිරීම මගින් ගොවීන්ට ශක්තිමත් ආර්ථික හා සමාජීය තත්ත්වයන් ලබා ගැනීමට හැකියාව ලැබේ.** විවිධ කෘෂිපාදක කර්මාන්ත ඇසුරු කරගෙන ව්‍යවසායකයන් බිහිවීමෙන් රැකියා හා ස්වයං රැකියා ලැබීමේ අවස්ථා උදවෙයි. මෙලෙස ගම් මට්ටමෙන් අරඹා ජාතික මට්ටම දක්වා ගොවි

*30 වෙනි පිටුවට ........*

**ඩබ්.එම්.ජී.බී. ගිරාගම**

අංශ ප්‍රධාන

***වාරි ජල කළමනාකරණ සහ ගොවිජන සම්බන්ධතා අංශය***

හෙක්ටර් කොබ්බෑකඩුව

ගොවිකටයුතු පර්යේෂණ හා

පුහුණු කිරීමේ ආයතනය

22 වෙනි පිටුවෙන් ...............

## ගොවි සංවිධාන ............

සංවිධාන හා ගොවි සමාගම් වර්ධනය වීමත් දේශීය හා විදේශ වෙළඳ පොලට නිෂ්පාදන සැපයීමත් මගින් පොදු සංවර්ධනයට දයක වීමට ගොවි ජනයාට හැකිවේ. එය එක් එක් ගොවීන්ට තනි තනිව කළහැකි කාර්යයක් නොව සාමූහිකත්වයේ ප්‍රතිඵලයකි. **පසුගිය වකවානුව තුල කෘෂිකර්ම හා වෙළඳ අමාත්‍යාංශයන් සහයෝගයෙන් කටයුතු නොකල නිසා බොහෝ අවස්ථාවල ගොවීන්ගේ අස්වැන්න ලැබෙන අවස්ථාවලදී එම ද්‍රව්‍යම ආනයනය කිරීම හේතුවෙන් මිල පහල වැටීම් සිදුවීම ගොවීන්ගේ ආර්ථිකය කෙරෙහි විශාල බලපෑමක් ඇති කළේය.** මෙම තත්ත්වය වෙනස්කර පාරිභෝගිකයා සඳහා සහන සැලසීම සඳහා අස්වැන්න නෙලීමට සැලකිය යුතු කාලයට පෙර (තොග අවසන්ව ඇතිවිට) පමණක් අවශ්‍යතාව මත ආනයනය කිරීමට පියවරගත යුතු වේ. මෙම කාර්යයේදී අපනයනයට යොදගන්නා ක්‍රමය (ගුවන් මගින් හෝ නැවු මගින්) සලකා ඒ වෙනුවෙන් ගතවන කාලය ද

**පොදු තීරණ ක්‍රියාවේ යෙදවීම ඉතාමත් අවශ්‍ය වේ.**

අවධානයට ගත යුතුය. ඉන්දියාව වැනි රටවල කවර ආකාරයකට අඩු නිෂ්පාදන වියදමක් සහිතව කෘෂි නිෂ්පාදන කරන්නේ ද යන්න සොයා බලා අත්දැකීම් ලැබීමට ගොවීන්ට හා නිළධාරීන්ට අවස්ථාව ලබාදිය යුතු අතර එවැනි ක්‍රම ක්‍රියාවට නැගීමට අවශ්‍ය පහසුකම් ලබාදීම වැදගත් වේ. ක්‍රියාවට නැගීමට අවශ්‍ය පහසුකම් ලබාදීම ද වැදගත් වේ. එමෙන්ම, කෘෂි නිෂ්පාදන කල් තබා ගැනීමට හා එමගින් කෘෂි පාදක කර්මාන්ත කිරීම දිරි ගැන්වීම සඳහා සුදුසු පියවර ගැනීමට අදල රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන පියවර ගැනීම අත්‍යාවශ්‍යය.

**මෙමගින් ගොවීන් ගොවි සංවිධාන හා ගොවි සමාගම් ශක්තිමත් ආර්ථිකයකට හිමිකම් කීමෙන් පොදුවේ ලාංකික ගොවියාට අභිමානවත් පිරිසක් ලෙස වාසය කිරීමට අවස්ථාව උදවනු නිසැකය.**

*මෙම **ගොවි ජනතා** ප්‍රකාශනය සකස් කොට එළි දක්වීමේ දී, ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිළධාරී එස්. රාමේස්වරන් මහතාගෙන් ලැබුණ සහයෝගයත්, ආයතනයේ පර්යේෂණ ප්‍රජාවගෙන් ලැබුණ සහයෝගයත්, අගය කරමි.*

**- සංස්කාරක -**